**එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව - 2016**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 30 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**
**--------------------------------------------------**

වර්ෂ දෙකක් ඉක්ම වූ රු.7,598,610 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ආපසු ලබා දී නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**
**------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**
**----------------**

සභාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.11,161,865 කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 30,764,081 ක් විය.

**2.2 ආදායම් කළමනාකරණය**
**----------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයේදී අයකර ගත යුතු රු.746,624 ක් වටිනා විනෝද බදු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**
**------------------------------------**

සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත අනුව සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේදීම රු.මිලියන 50.3 සිට රු.මිලියන 22.5 ක් දක්වා පරාසයක මුදල් ශේෂයක් පැවතුණි. මෙය

පොළී උපදවිය හැකි ස්ථාවර තැන්පතුවල හෝ ඒක්ෂණ තැන්පතුවල ආයෝජනය කර ආදායම් ඉපැයීමට කටයුතු නොකිරීම නිසා සභාව විසින් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.මිලියන 2.4 ක පොළී ආදායමක් අහිමි කරමින් පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

වෙන්කල්ලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.175,000 ක් වටිනා ට්‍රැක්ටරය 2013 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට භාර දී එය භාවිතා කරමින් පැවතුණත් එහි අයිතිය සභාවේ නමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයේ පවතින රු.50,000 කට අගය තක්සේරු කළ යතුරු පැදිය, අත් ට්‍රැක්ටරය සහ රු.1,750,000 ක් වටිනා ලොරි රථය අලුත්වැඩියා කර භාවිතයට නොගෙන වර්ෂ 03 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සභාවට අයත් කිලෝ වොට් 10 ක විදුලි ජනක යන්ත්‍රය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර 2013 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එකතු කරනු ලබන කසල උපයෝගි කරගෙන කාබනික පොහොර නිපදවීමට ආසියා ෆවුන්ඩේෂන් ආයතනයේ මූල්‍යාධාර යටතේ 2010 වර්ෂයේ රු.320,000 ක් වටිනා කාබනික පොහොර නිපදවීමේ යන්ත්‍රයක් හා විදුලි ජනක යන්ත්‍රයක් ලබාගෙන තිබුණි. එසේ වුවත්, එම යන්ත්‍රය භාවිතයට නොගෙන 2017අප්‍රේල් 26 දින තෙක් මල බැඳී තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නිරවුල් නොකළ විගණන ඡේද**

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ ඌනතාවයන් සහ අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | අන්තර්ගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 2.2.3 (අ) | හිඟ හිටි සේවක ණය රු.841,091 ක් වර්ෂ 14 ක සිට අයකර ගෙන නොතිබීම. |
| 2015 | 2.2.4(අ) | ඇප මුදල් ලබාගත යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබීම. |
| 2015 | 2.2.3 | හිඟ හිටව පවතින මස්කඩ බදු දීම සහ වෙළඳපොල බදු දීමේ මුදල් අයකර ගැනිමට කටයුතු නොකිරිම. |
| 2015 | 3.2.3 | ස්ථාපිත කරනු ලැබූ සන්නිවේදන කුළුණුවලින් ගාස්තු අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2015 | 3.2.4 | දේපළ මත වරිපනම් බදු අයකිරීමට කටයුතු නොකිරීම. |

**4.2 පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | හානියට පත් වාහන හා යන්ත්‍ර අලුත්වැඩියා කර භාවිතයට ගැනීම. |